my copy

'2 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023-02-08

පැමිණිලි පාර්ශවය : ජේ.ඒ.සී. ජගත් මහතා,
අංක. 207/17, පට්ටියකැලේවත්ත,
තල්වත්ත, මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/ ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : HRC/KND/160/22/I</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තම පුතාවන ජූලියස් ආරච්චිලාගේ සස්මිත අනුහස් 2022 පළමු වසර සඳහා තම ආසන්න පාසල වන මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා නියමිත කාලය තුල ආසන්න පදිංචිය යටතේ අයදුම්පතක් යොමුකර එහි ප්‍රථම සම්මුඛ පරික්ෂණයට RS – 286 යටතේ 2021.11.12 වන දින පෙනී සිට ලකුණු 84ක් ලබාගත් බවත්, සම්මුඛ පරික්ෂණ මණ්ඩලය 2021.12.10 වන දින පෙ.ව.8.00 ට පමණ පදිංචිය තහවුරු කරගැනීම සඳහා ස්ථානීය පරික්ෂණයට පැමිණ තිබූ බවත්, තමා එම අවස්ථාවේ රැකියාවේ යෙදෙන දඹුල්ල ප්‍රදේශයේ ඉමේජ් ආයතනයට රැකියාව සඳහා ගොස් සිටි අතර, බිරිඳ දරුවා ළදරු පාසලට දැමීමට ගොස් සිටි බවත්, පසුව තම බිරිඳ පාසලෙන් පැමිණි බව ආරංචි වී නිවසට පැමිණි අවස්ථාවේ සම්මුඛ පරික්ෂණ මණ්ඩලයේ නිලධාරින් සියළු ලේඛන බලා "ස්ථිර පදිංචියක් නෑ නේද" යනුවෙන් පවසා ඇති බවත් සඳහන් කර ඇත. අනතුරුව ඔප්පුද පරික්ෂා කර එය ව්‍යාජ ඔප්පුවක් බව පවසා කිසිදු සාධාරණ පදනමකින් තොරව ලකුණු ලේඛණයෙන් "ස්ථානීය පරික්ෂණයේදී ප්‍රතික්ෂේප කරන ලදී" යනුවෙන් සටහන් යොදා එහි අත්සන් කරන ලෙස බිරිඳට බලකර ඇය අත්සන් කළ පසු එකී ලේඛනය බිරිඳ වෙත ලබාදී තිබූ බවත් දක්වා ඇත. අනතුරුව ප්‍රදර්ශනය කරන ලද තාවකාලික ලේඛනයේ හෝ පොරොත්තු ලේඛනයේ දරුවාගේ නම සඳහන් නොවීම නිසා අභියාචනයක් කරන ලද බවත්, අභියාචනා පරික්ෂණය 2022.03.04 දින පවත්වන ලද බවත්, එහිදී තමා එම නිවසේ පදිංචි වී නොසිටි බවට වාර්තා වී ඇති බව ප්‍රකාශ කරන ලද බවත් දක්වා ඇත. තමා ඊට කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, තමා රැකියාව කරනුයේ දඹුල්ල ප්‍රදේශයේ බවත්, සම්මුඛ පරික්ෂණ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு } 1996
වෙබ් / இணையம் } www.hrcsl.lk

මණ්ඩලයේ නිලධාරීන් එන විට තමා රැකියාව සඳහා පිටත්ව ගොස් සිටි අතර, බිරිඳ ද දරුවා පෙර පාසලට ඇරලීම සඳහා ගොස් සිට ටිකවේලාවකින් නිවසට පැමිණ තොරතුරු ලබාදුන් බවත්ය. අභියාචනා මණ්ඩලයේ නිලධාරීන් විසින් නැවත ස්ථානීය පරීක්ෂණයක් සඳහා පැමිණෙන බවට ප්‍රකාශ කරන ලද බවද දක්වා ඇත.

2022.03.18 වන දින අභියාචනා හා විරෝධතා මණ්ඩලයෙන් නිවසට පැමිණි අතර, එදිනද තමා රැකියාව සඳහා පිටත්ව ගොස් සිටි බවත්, තම බිරිඳ දරුවන් දෙදෙනා හා මව නිවසේ රැඳී සිට ඇති බවත්, එදින කිසිදු ලේඛනයක් හෝ තොරතුරක් ලබානොගෙන මාගේ දියණියගෙන් පාසල කුමක්ද ගුරුතුමිය කවුද යන ප්‍රශ්නය පමණක් අසා පිටව ගොස් ඇති බවත් සඳහන් කර ඇත. නිවසේ නිවැසියන් සිටි බව සනාථ කිරීමට ලේඛනයකට හෝ අත්සන් ලබාගෙන නොමැත. ඉන්පසු 2022.03.29 වන දින ප්‍රදර්ශනය කරන ලද අවසන් නාමලේඛනයේ තම දරුවාගේ නම සඳහන්ව නොතිබූ බවද දක්වා ඇත. ඒ අනුව කිසිදු සාධාරණ පරීක්ෂණයකින් තොරව හා ලේඛන නිසිලෙස අධ්‍යයනයකින් තොරව සත්‍ය කරුණු පදනම් නොකර සියළු කරුණු නියමිත ලෙස ඉදිරිපත් කර තිබියදී හා ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු 84ක් ගෙන සුදුසුකම් ලබා තිබුනද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂණයේදී ඔවුන් පැමිණි අවස්ථා දෙකේදීම තමා හැර (රැකියාව සඳහා පිටත්ව ගොස් සිටි නිසා) බිරිඳ හා දරුවන් නිවසේ සිටියත්, ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා පදිංචිය ලේඛන මගින් තහවුරු කිරීමට නොහැකි බව සඳහන් කර ධර්මරාජ විද්‍යාලයට තම දරුවා ඇතුළත් කිරීමේ අවස්ථාව අහිමිකරන ලද බව පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

වගඋත්තරකාර විදුහල්පතිගේ ලිඛිත කරුණු දැක්වීම :-

කැඳවීම් අංක RS- 284 යටතේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ජේ.ඒ.සී.ජගත් මහතා පෙනී සිටි ඇති අතර, 13/2021 චක්‍රලේඛන විධිවිධානවලට අනුව ඔහු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු 84ක් ප්‍රධානය කර ඇති බවත්, අනතුරුව එකී චක්‍රලේඛනයේ 6.1 (අ) වගන්තියට අනුව අයදුම්කරුවන්ගේ පදිංචිය ලිඛිතව හා භෞතිකවද සනාථ කරගත යුතු බැවින් 2021.12.13 වන දින විද්‍යාලයේ විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් පැමිණිලිකරු පදිංචි යැයි සඳහන් අංක 207/17, පට්ටියකැලේවත්ත, තල්වත්ත ස්ථානයෙහි අයදුම්කරු හා පවුලේ සාමාජිකයින් භෞතිකව පදිංචිව සිටිද යන්න පරීක්ෂා කිරිම සඳහා කටයුතු කරන ලද බවත් දක්වා ඇත. එම අවස්ථාවේ අයදුම්කරු හා ඔහුගේ බිරිඳ ඇතුළු පවුලේ කිසිදු සාමාජිකයෙකු නොසිටි අතර, පසුව අයදුම්කරුගේ බිරිඳ පැමිණි බවත්, එහිදී අයිතිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද මහනුවර කඩවත් සතර ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද අංක KDS/KGK/4/3/56/13/12 හා 2017.09.21 දිනැති මුල් උරුමය ලියාපදිංචි කිරීම - මහා/ප්‍ර/1012 ලිපියෙහි සඳහන් අංක 207/17, පට්ටියාකැලේවත්ත, තල්වත්ත මහනුවර යන නිවාස අංකය සඳහන් නිවාස 02ක් මෙම ඉඩමෙහි යාබදව පිහිටා ඇති බවද, මෙම නිවස 02 සඳහාම එකම ලිපිනයට විදුලි සහ ජල බිල්පත් ලබාගෙන ඇති බවද, අයදුම්කරු හා අයදුම්කරුගේ සහෝදරයෙකු මෙම නිවාසවල පදිංචි බවද, මෙම නිවාස 02 අතුරින් මුලින්ම ඉදිකරන ලද නිවස වන අයදුම්කරුගේ සහෝදරයා දැනට පදිංචිව සිටින නිවසට අදාළව ඉහත ලේඛනය අයදුම්කරුගේ පියාගේ නමට නිකුත් කර ඇති බවද නිරීක්ෂණය කරන

ලද බව සඳහන් කර ඇත. තවද අංක KDS/KGK/4/3/56/13/12 දරණ ලිපියෙහි සඳහන් දේපල ලෙස හඳුන්වනු ලබන්නේ තමන්ගේ නිවස බවට අදාල නිවාස 02 හිම පදිංචිකරුවන් විදුහල්පති ප්‍රමුඛ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියෙහි ආරවුලක් ඇතිකර ගන්නා ලද බවත්, ඒ අනුව අදාළ දේපල සම්බන්ධව අයදුම්කරුට නිවැරදි අයිතියක් නොමැතිවීම තහවුරුවීම නිසා 13/2021 චක්‍රලේඛනයේ 6 (ඊ) වගන්තියට අනුව "පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපිලේඛන ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ පදිංචිව සිටින ස්ථානයට අදාළව තිබිය යුතුය" යන කොන්දේසි කඩවී ඇති බව නිරීක්ෂණය වී ඇත. විද්‍යාලයේ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින්ද උක්ත නිවස පරීක්ෂා කරන ලද අතර, එම අවස්ථාවේදිද අයදුම්කරු හා පවුලේ සාමාජිකයින් භෞතිකව පදිංචිව සිටින ස්ථානයට අදාළව නිරවුල් ලිඛිත අයිතියක් පෙන්වීමට අපොහොසත් වීම හේතුවෙන් ළමයා ඇතුළත් කරගැනීමට නොහැකි වී ඇති බව සඳහන් කර ඇත.

**නිරීක්ෂණ -:**

නිරීක්ෂණ සඳහා අදාළ කරගත් ලේඛණ,

01. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් ලබාදුන් ලකුණු ලේඛණය.
02. ගහවට කෝරලයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ මුල් උරුමය ලියාපදිංචි අංක KDS/KGK/4/3/56/13/12 හා 2017.09.21 දිනැති ලිපිය හා ඊට අදාල පත්ඉරු
03. ඡන්ද ලියාපදංචි ලේඛනය
04. විදුහල්පතිවරයාගේ ලිඛිත සැළ කිරිම.

පැමිණිලිකරු විසින් ඔහුගේ දරුවා ඇතුළත් කිරීම සඳහා පාසැල්වට දරුවන් ඇතුළත් කිරිමෙ 13/2021 චක්‍රලේඛනයේ විධිවිධානවලට අනුකූලව ආසන්න පදංචි ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණ සඳහා 2021.11.12 වන දින ඉදිරිපත් වී ඉන් ලකුණු 84ක් ලබාගෙන ඇත.

එකී ලකුණු ලබාදීමෙන් පසුව 13/2021 චක්‍රලේඛනයේ 6.1 (අ) වගන්තියට අනුව ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරු අයදුම්කරන ලද ස්ථානයේ භෞතිකව පදිංචි වී ඇද්ද යන්න පරීක්ෂා කිරිම සඳහා විද්‍යාලයේ විදුහල්පති හා සාමාජිකයින් 04 දෙනෙකු ස්ථානයට ගොස් ඇති අතර, එම මොහොතේ පැමිණිලිකරු හෝ කිසිදු සාමාජිකයෙකු නිවසේ සිට නොමැති බව නිරීක්ෂණය වේ. ඊට හේතුව ලෙස පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත්තේ, ඔහු රැකියාව ලෙස දඹුල්ල ප්‍රදේශයේ ඉමෙජ් නැමති කර්මාන්ත ශාලාවේ සේවය කරන බැවින් දිනපතා නිවසට නොපැමිණෙන අතර, සති අන්තයේ නිවසට පැමිණෙන බවයි. ඔහුගේ බිරිඳ දරුවා ළදරු පාසලට ඇරලීමට ගොස් සිට ඇති අතර, පාසලෙන් පැමිණි බව ආරංචි වී නිවසට ගොස් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉල්ලන ලද තොරතුරු ලබාදී ඇති බවද දක්වා ඇත. එහිදී අසල නිවසක පදිංචි අයකු සමඟ දේපල සම්බන්ධව ආරවුලක් ඇති කරගත් බවත්, එහිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ පදිංචි දේපල සම්බන්ධව ආරවුලක් ඇති බව ඒත්තු යාම නිසා "අයදුම්කරනු ලබන ස්ථානයේ ලිපිලේඛන තහවුරු නොවීම මත " යන සටහන් යොදා

ඉල්ලුම්කරුගේ බිරිඳගෙන් අත්සන් ලබාගෙන ඇති අතර, ඉන් නිරික්ෂණය වනුයේ, අයදුම්කරු භෞතිකව එම ස්ථානයේ ඒ වන විට පදිංචිව සිටි බවයි.

අදාළ දේපළ පැමිණිලිකරුගේ පියාගේ පියා වන ජේ.ඒ.පොඩිඅප්පු මහතා විසින් 2017.09.25 වන දින පැමිණිලිකරුගේ පියා වෙත පවරා ඇති බව ගහවට ප්‍රාදේශීය ලේකම්වරයාගේ 2017.09.21 වන දිනැති ලිපියෙන් නිරික්ෂණය වේ.

පැමිණිලිකරු සම්මුඛ පරික්ෂණයේදී ලකුණු 84 ක් ලැබුවද ස්ථානීය පරික්ෂණයේදී පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කරන ලද ලේඛන අසමත් බව දක්වමින් තාවකාලික ලේඛනයට දරුවාගේ නම ඇතුළත් නොකිරිම හේතුවෙන් අභියාචනයක් කරන ලද අතර, එකී අභියාචනා පරික්ෂණ 2022.03.18 සිදුකර ඇත. එහිදී ඔහුට ලකුණු ලබාදීමක් සිදුනොකර ඇති අතර, ප්‍රථම සම්මුඛ පරික්ෂණය මගින් භෞතිකව ස්ථානය පරික්ෂා කිරීමේදි කරන ලද සටහන් අනුව නැවත ස්ථානිය පරික්ෂණයක් සිදුකිරීමට පැමිණෙන බව දැනුම් දීම අනුව 2022.03.18 වන දින අයදුම්කරු පදංචි ස්ථානයට සම්මුඛ පරික්ෂණ මණ්ඩල නිලධාරින් පැමිණ ඇති බව නිරික්ෂණය වේ. එම අවස්ථාවේ පැමිණිලිකරු හැර ඔහුගේ බිරිඳ හා දරුවන් දෙදෙනා සිටි නමුත් ඔවුන්ගෙන් කිසිවක් විමසා නොමැති අතර, ලකුණු ලේඛනය සඳහා අත්සන් ද ලබාගෙන නොමැති බවත්, අයදුම්කරු හා පවුලේ සාමාජිකයන් භෞතිකව පදිංචි ස්ථානයේ නිරවුල් ලිඛිත අයිතියක් පෙන්විමට අපොහොසත් වූ බවත් සඳහන් වේ. මෙහිදී ද අභියාචනා මණ්ඩලය විසින් සලකා බලා ඇත්තේ, පැමිණිලිකරුගේ ලිඛිත ලේඛන මිස භෞතික පදිංචිය නොවන බව තවදුරටත් නිරික්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ඡන්ද ලේඛන උපුටන අනුවද අදාළ ස්ථානයේ පදිංචිව සිටින බව නිරික්ෂණය වේ.

විදුහල්පතිවරයා විසින් කොමිෂන් සභාවට යොමුගත 2022.05.12 දින ලිපියේ 03 හා 04 ඡේද අනුව නිරික්ෂණය වනුයේ, අදාළ අයදුම්කරු එම ස්ථානයේ පදිංචිය පිළිබඳ ගැටළුවක් ඇති බවත්, එය තහවුරු වන්නේ, ලිඛිත ලේඛනවල ඇති ගැටළු සහගත බවත් යන්නයි. 2013/21 චක්‍රලේඛණයෙන් 6.1 (අ) වගන්තිය අනුව ලිඛිත ලේඛනවලින් සනාථ වන පදිංචිය තවදුරටත් තහවුරු කරගැනීම සඳහා භෞතිකව ස්ථානීය පරික්ෂණයක් සිදුකළ යුතු බව සඳහන් වීමට අනුව කරන ලද ස්ථානීය පරික්ෂණවලදි අදාළ ලේඛන පදිංචිය තහවුරු කිරිමට නොහැකි යැයි සඳහන් කිරිම හා අයදුම්කරුට නිරවුල් අයිතියක් නොමැති වීම කෙසේ තහවුරු කර ඇත්තේ ද යන්න මෙහිදී නිරික්ෂණය නොවේ.

පැමිණිලිකරු විසින් ප්‍රථම සම්මුඛ පරික්ෂණයේදී ලිඛිත ලේඛන මගින් පදිංචිය සනාථ කරමින් ඊට අදාළ ලකුණු ලබාගෙන ඇති අතර, භෞතික පරික්ෂණයේදී ලිඛිත ලේඛන තවදුරටත් සනාථ කිරීමට අපොහොසත් වී ඇති බව විදුහල්පති විසින් ප්‍රකාශ කිරීම ගැටළුවක් වන අතර, එසේ ප්‍රකාශ කිරිමට සාධාරණ හේතු ද නොමැති බව නිරික්ෂණය වේ.

අදාළ දේපලෙහි නිවාස දෙකක් ඇති අතර, ඒ පිළිබඳ ගැටළුවක් තිබුනේ නම්, පැමිණිලිකරුගේ පියාගෙන් හා මවගෙන් හෝ ආරවුල් පාර්ශවයෙන් ප්‍රකාශ ලබාගත යුතුව තිබුණි. එවැනි ප්‍රකාශයක් හෝ ලබාගෙන නොමැතිව පදිංචිය ලිඛිතව තහවුරු කිරිමට නොහැකි බව පවසා අයදුම්පත ප්‍රතික්ෂේප කිරිම තුළින් පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බව නිරික්ෂණය වේ.

දේපොල අයිතිය පිළිබඳ ආරවුලක් ඇතිවූ පමණින් පදිංචිය හෝ දේපොල අයිතිය නිශේධවන්නේ නැත. එය අධිකරණමය කරුණකින් තහවුරු විය යුතුය.

**නිගමනය :-**

පැමිණිලිකරු විසින් අදාළ ස්ථානයේ පදිංචිය ප්‍රථම සම්මුඛ පරික්ෂණ මණ්ඩලයේදි ලිඛිතව තහවුරු කර ඊට අදාළ ලකුණු සමඟ මුළු ලකුණු 84ක් ලබාගෙන ඇත. ස්ථානීය පරික්ෂණයේදී ද පදිංචි ස්ථානයේ අවස්ථා දෙකේදීම සිටි බවට පැමිණිලි පාර්ශවය හා වගඋත්තර පාර්ශවයේ ලේඛන අනුව පෙනි යන බැවින් භෞතිකව පදිංචිය පිළිබඳව හා ලිඛිතව පදිංචිය පිළිබඳව ගැටළුවක් පැන නොනගී. ඒ අනුව නිගමනය වන්නේ, පැමිණිලිකරු 2013/21 දරණ චක්‍රලේඛනයේ පදිංචියට අදාළව සියළු සුදුසුකම් සපුරා ඇති බවයි.

මෙම කරුණු අනුව, පැමිණිලිකාර ජේ.ඒ.සී.ජගත් මහතාගේ දරුවා වන ජේ.ඒ.සස්මිත අනුහස් දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා, අභියාචනා මණ්ඩලයේ සභාපති යන අය විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

> ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරුගේ දරුවා වන ජේ.ඒ.සස්මිත අනුහස් දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ නියමිත ශ්‍රේණියට (2022 වර්ෂයේ 1 වන ශ්‍රේණියට) ඇතුළත් කරගැනීම සඳහා කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. ලූ. 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. Vijitha Nanayakkara**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/